6 39

# මධ්‍යම පළාත් සභාව

## මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ
## ශිල්පීය නොවන සේවා ගණයට අයත් සේවා ව්‍යවස්ථාව

**01. ක්‍රියාත්මක වන දිනය**

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ඇති ආයතන හා පාසල් වලට අදාල ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවා ගණයට අයත් තනතුරු වලට පත් කිරීම හා උසස් කිරීම මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසි හා නියමයන් මගින් පාලනය වේ. මෙයට පෙර අනුමත කරන ලද පරිපාටිවල සඳහන් විධිවිධානවලට අනුකූලව ගෙන ඇති යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙම පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරනු ලබන දිනක සිට වලංගුවනු ඇත. මෙම ව්‍යවස්ථාව මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපනය විෂය භාර ලේකම්වරයාගේ පාලනයට යටත් වේ.

**02. නිර්වචන**

2.1 "ව්‍යවස්ථා සංග්‍රහය" යන පදයෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරිපාලනයට යටත් අධ්‍යාපන කලාප කාර්යාල, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල, අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා පාසල් ද ඇතුලුව සියලු ආයතන වලට පත්කරනු ලබන ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවා ගණයට අයත් කාර්යමණ්ඩල සඳහා අදාළ වන ව්‍යවස්ථා සංග්‍රහයයි.

2.2 සේවා ගණය යන පදයෙන් අදහස් කරනුයේ ඉහත 2:1 හි සඳහන් ආයතන වල සියලුම ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවා ගණයයි මෙම සේවා ගණයට අයත් තනතුරු මෙම සේවා ව්‍යවස්ථාවේ උපලේඛන අංක 01 යටතේ ඇති තනතුරු විය යුතුය.

**03. ව්‍යුහය**

අංක 4 යටතේ සඳහන් වැටුප් පරිමාන සහිත III වන ශ්‍රේණියට බඳවා ගනු ලබන සේවකයින්ගෙන් සහ II වන ශ්‍රේණියට, I වන ශ්‍රේණියට,විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන සේවකයින්ගෙන් සේවා ගණය සමන්විතවේ.

**04. වැටුප් ව්‍යුහය**

මෙම සේවා ගණයට අයත් වැටුප් ව්‍යුහය පහත පරිදි වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006(iv) හි සඳහන් විධිවිධාන වලට යටත්ව **මාසික වැටුප් පරිමාණ අදාල කර ඇත.**

| | | | |
|---|---|---|---|
| 4.1.1 | III වන ශ්‍රේණිය | රු | 11730 – 10 X 120 - 12930 |
| 4.1.2 | II වන ශ්‍රේණිය | රු. | 13060 – 10 X 130 - 14360 |
| 4.1.3 | I වන ශ්‍රේණිය | රු | 14375 – 10 X 145 - 15825 |
| 4.1.4 | විශේෂ ශ්‍රේණිය | රු. | 15840 – 12 X 160 - 17760 |

ආණ්ඩුකාරතුමා විසින්
2008.08.05 දින
අනුමත කරන ලදී
ජීසීඑස්/3/6 ගොනුව

## 05. සේවක සංඛ්‍යාව

5.1 වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුවෙන් අනුමත කර ඇති මෙම සේවා ගණයට අයත් මුළු සේවක සංඛ්‍යාව නොඉක්ම වනු ඇත. මෙම ව්‍යවස්ථාවේ අංක 2:1 යටතේ සඳහන් කර ඇති ආයතන වල අවශ්‍යතා ජාතික ප්‍රතිපත්ති මත රේඛීය අමාත්‍යාංශය විසින් වරින්වර තිරණය කරනු ලබන තිර්ණායක පදනම් කරගෙන සේවක සංඛ්‍යා තිරණය කරනු ලබන විට අදාල වන වෙනස් වීම් ද ලේකම්වරයා විසින් කළමනාකරණසේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යොමුකර අනුමත කරගත යුතුය.

## 06. පාලනය

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපනය විෂය පිළබඳ අමාත්‍යාංශ ලේකම්ගේ පාලනයට යටත් වේ.

## 07. සේවයේ නියුක්ත කිරීම හා සේවා කොන්දේසි

7.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

7.2 වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

7.3 මෙම සේවා ගණයේ 111 වන පන්තියට පමණක් විවෘත බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර 11 වන/ 1 වන හා විශේෂ ශ්‍රේණි වලට උසස් වීම් මගින් බඳවා ගනු ලැබේ.

7.4 මෙම සේවා ගණයට අයත් සෑම සේවකයෙක්ම මෙම සේවා ගණයට අයත් ඕනෑම තනතුරක නියමිත කාර්යයන් ඉටුකිරීමට බැදි සිටි.

7.5 111 වන ශ්‍රේණියට බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් විය යුතුය. පරිවාස කාලය තුළ සම්පූර්ණ කළ යුතු සුදුසුකම් සපුරා ඇති අය සිය තනතුරේ ස්ථිර කිරීමට සලකා බලනු ඇත. 11 වන. 1 වන හා විශේෂ ශ්‍රේණි තනතුරකට උසස් කරනු ලබන සෑම තැනැත්තෙකුම එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාලයකට යටත් විය යුතුය.

7.6 මෙම සේවා ගණයට අයත් සේවකයින් ස්ථාන මාරු කිරීමට යටත් වෙති. ඔවුන් මධ්‍යම පළාතේ කවර හෝ ප්‍රදේශයකට පත්කර යැවීමට පුලුවන. මෙම ව්‍යවස්ථාවේ “අ” උපලේඛනයේ දක්වා ඇති තනතුරු වලට අයත් සේවකයින් ස්ථාන මාරු කිරීම ආයතන සංග්‍රහයේ විධි විධාන වලට හා/ හෝ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති ස්ථාන මාරු පරිපාටිකට අනුව විය යුතුය.

7.7 මෙහි ඉහත 7.1 සිට 7.6 දක්වා කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ 11 වන පරිච්ඡේදයේ බඳවා ගැනීම් සඳහා වන අනෙකුත් පොදු කොන්දේසි අදාල විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
......2008.08.05 දින

**08. III වන ශ්‍රේණියට බඳවා ගැනීම.**

8.1 මෙම සේවා ගණයට අයත් තනතුරුවල 111 වන පන්තියට විවෘත තරග විභාග ප්‍රතිඵල මත ඇබෑර්තු සංඛ්‍යාවෙන් 70% ක් සඳහා නව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

8.2 බඳවා ගනු ලබන අවස්ථාව වනවිට සේවයේ යෙදී සිටින සහ අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ මෙම ව්‍යවස්ථාවේ 2:1 හි සඳහන් ආයතනවල සේවයේ නියුක්තව සිටින සේවකයින්ගෙන් ඇබෑර්තු සංඛ්‍යාවෙන් 30% සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. එහිදී මෙම ව්‍යවස්ථාවේ සඳහන් සේවා ගණයට අයත් සේවාවල සේවකයින් සේවයේ ස්ථිර කිරීමට අදාලව වරින්වර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ලදුව ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති චක්‍රලේඛ විධිවිධාන අදාල කර ගතයුතුය.

8.3 අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා ඒ යටතේ ඇති ආයතන වල සේවයේ සිටින සේවක සංඛ්‍යාව ඇබෑර්තු සංඛ්‍යාවෙන් 30% ක් නොඉක්මවන හෝ ඊට අඩුවන අවස්ථා වලදී එම ඇබෑර්තු සංඛ්‍යාව විවෘත තරග විභාග ප්‍රතිඵල මත සම්පූර්ණ කෙරේ.

8.4 යම් අවස්ථාවකදී පත් කළ යුතු සංඛ්‍යාව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති සීමාවන්ට යටත්ව, අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත තීරණය කරනු ඇත.

8.5 ඉල්ලුම් කිරීමේ ක්‍රමය.

විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කිරීමේ ක්‍රමය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ / ප්‍රසිද්ධ පුවත්පත්වල මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පළ කරන පරිදි වේ.

**09. ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන සේවා ගණයට අදාළ පොදු හා අධ්‍යාපන සුදුසුකම්**

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික විය යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මධ්‍යම පළාත් සහා බල ප්‍රදේශය තුළ වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබෙන බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(ආ) ඉල්ලුම්පත් බාරගැනීමේ අවසාන දිනය වන විට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. කෙසේ වුවද මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මකව ආරම්භ වන දිනය වන විට මධ්‍යම පළාත් සභා සේවයේ යෙදී සිටින අයට උපරිම වයස අදාල නොවේ.

(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර ශක්තියකින් යුක්ත විය යුතුය.

(ඇ) අ.පො.ස (සා/පෙළ ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී අඩුම වශයෙන් විෂයන් 06 ක් සමත්ව තිබීම. මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කරනු ලබන දිනට සක්‍රිය සේවයේ යෙදී සිටින සේවකයින් සඳහා 8 ශ්‍රේණිය (9 වසර) සමත් වීම ප්‍රමාණවත් වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
..2008.08.05.. දින
අනුමත කරන ලදී

## 10. කාර්යක්ෂමතා කඩඉම

10.1 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පහත සඳහන් නිර්නායකයන් පදනම් කරගෙන කාර්යක්ෂමතාව මැනීම කළ යුතුය.

### I වන කාර්යක්ෂමතා කඩඉම

III වන ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු 4 වන වැටුප් වර්ධකය උපයා ගැනීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

### II වන කාර්යක්ෂමතා කඩඉම

II වන ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු පෙනීසිටිය යුතුය. පළමුවන ශ්‍රේණියට උසස් කිරීම සඳහා II වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීම එක් සුදුසුකමකි. II වන පංතියේ 7 වන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

ඉහත කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල විෂය නිර්දේශය පහත පරිදි වේ.

| | විෂය | ලකුණු |
|---|---|---|
| I.. | රාජකාරි විෂය පිළිබඳ දැනුම | 40 |
| II. | වාර්ෂික කාර්ය සාධන ඇගයීම් වලදි දක්වා ඇති කුශලතාවය | 60 |
| | මුළු ලකුණු | 100 |

කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් වීම සඳහා මුළු ලකුණු සංඛ්‍යාවෙන් ලකුණු 40 කට වඩා ලබාගත යුතුය.

10.2 නියමිත දිනයට පෙර මෙම ව්‍යවස්ථාවෙන් පාලනය වන සේවාගණ සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම අමාත්‍යාංශ ලේකම්ගේ වගකීමකි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2008. 08. 05 දින
අනුමත කරන ලදී
[illegible]
ආණ්ඩුකාර [illegible]
[illegible]/3/6 [illegible]

## 11 11 වන ශ්‍රේණියට උසස් කිරීම

11:1 පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අවුරුදු 06 ක සක්‍රිය සේවා කාලයක් සහිත 111 වන පන්තියේ සේවය ස්ථිර කර ඇති නිලධාරීන් 11 වන පන්තියට උසස් කරනු ලැබේ.

11:1:1 උසස්වීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (මෙම ව්‍යවස්ථාවේ 15 වගන්තිය අදාල වේ)

11:1:2 නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත්ව තිබීම.

11:2 දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහත අවශ්‍යතා සපුරාලන සේවකයන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු අමාත්‍යාංශයේ ලේකම් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන පරීක්ෂාවකින් පසු සුදුසුකම් සපුරා ඇති අයට මෙම ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට නොගෙන උසස්වීම් ලබා දෙනු ඇත.

11:2:1 උසස්වීම් සිදු කරනු ලබන්නේ පුරප්පාඩු අනුව නොවන බැවින් එම පන්තියේම තනතුරක රාජකාරි පැවරීමට නොහැකි අවස්ථා වලදී වෙනත් පන්තියකට අයත් තනතුරක රාජකාරියේ යෙදවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත. උදාහරණයක් ලෙස 1 පන්තියට උසස්වීම ලැබුණ ද උපලේඛනයේ සඳහන් වන 1 වන පන්තියේ තනතුරක පුරප්පාඩුවක් නොමැති විට 111 වන පන්තියේ තනතුරක වුව ද රාජකාරි පැවරිය හැකිය.

## 12. 1 වන ශ්‍රේණියට උසස් කිරීම

12:1 පහත සඳහන් සුදුසුකම් සපුරාලන 11 වන ශ්‍රේණියේ අවුරුදු 10 ක සක්‍රිය සේවා කාලයක් සහිත 11 වන ශ්‍රේණියේ නිලධාරීන් 1 ශ්‍රේණියට උසස් කරනු ඇත.

12:1:1 උසස්වීම ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම. (මෙම ව්‍යවස්ථාවේ 15 වගන්තිය අදාල වේ)

12:1:2 නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබීම.

## 13. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

පහත සඳහන් සුදුසුකම් සපුරාලන 1 වන ශ්‍රේණියේ අවුරුදු 12 ක සක්‍රිය සේවා කාලයක් සහිත 1 වන ශ්‍රේණියේ සේවකයින්ගෙන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන සේවකයින් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ඇත.

1. උසස්වීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලබන අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

11. සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

111. නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත් වී තිබීම

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014/09/20 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම් 2014/09/25

**14.** 14:1 පළමුවන හා විශේෂ ශ්‍රේණි සඳහා උසස්වීම් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානින් විසින් ඉහත අවශ්‍යතා සපුරන සේවකයින් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කල පසු අමාත්‍යාංශ ලේකම් විසින් පලාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන පරීක්ෂාවකින් පසු සුදුසුකම් සපුරා ඇති අයට අදාල ශ්‍රේණිවල පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට නොගෙන උසස්වීම් ලබාදීමට තීරණය කරනු ඇත.

14:2 උසස්වීම් සිදු කරනු ලබන්නේ පුරප්පාඩු අනුව නොවන බැවින් එම පන්තියේම තනතුරක රාජකාරි පැවරීමට නොහැකි අවස්ථාවලදී වෙනත් පන්තියට අයත් තනතුරක රාජකාරියේ යෙදවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

උදාහරණයක් ලෙස 1 පන්තියට උසස්වීම් ලැබුණද අ උපලේඛනයේ සඳහන් වන 1 වන පන්තියේ තනතුරක පුරප්පාඩුවක් නොමැති විට 111 වන පන්තියේ තනතුරක වුව ද රාජකාරි පැවරිය හැකිය

**15.** **සතුටුදායක සේවා කාලය පිළිබඳ අර්ථකථනය**

උසස්වීම් ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වූ වසර 5 තුළ කළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නැත්තාවූද එම කාලය තුළ යෙදුණු සියලුම වැටුප් වර්ධක නියමිත දිනට ලබා ගත්තාවූද, සක්‍රිය සේවයක් ඇත්තාවූද, සේවකයකු පමණක් සතුටුදායක සේවා වාර්තාවක් ඇත්තකු සේ සලකනු ලැබේ.

**16.** **රාජකාරි පැවරීම**

අදාල සේවා අවශ්‍යතාවය, ජ්‍යෙෂ්ඨත්වය, පළපුරුද්ද ආදිය පදනම් කරගෙන අමාත්‍යාංශයේ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා විසින් රාජකාරි පවරා දෙනු ඇත.

**17.** **වෙනත් රෙගුලාසි**

මෙම ව්‍යවස්ථාවේ පනවා ඇති කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලටද, මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් වරින්වර නිකුත් කරනු ලබන රෙගුලාසි හෝ නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිති.

**18.** **සේවයේ නිරත වූවන් අන්තර්ග්‍රහනය කිරීම**

18:1 මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක දිනට පෙර මෙම සේවා ගණයට අයත් තනතුරුවල සේවයේ නිරත සේවකයින් ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට අන්තර්ග්‍රහනය කිරීම පහත සඳහන් පරිදි ක්‍රියාත්මක වේ.

| | දැනට සිටින ශ්‍රේණිය හා සේවා කාලය | නව ව්‍යවස්ථාව අනුව අන්තර්ග්‍රහනය වන ශ්‍රේණිය |
|---|---|---|
| 18:1(අ) | වසර 06 කට නොවැඩි සතුටුදායක සේවා කාලයක් සහිත III ශ්‍රේණියේ සේවකයින් | III ශ්‍රේණිය |
| 18:1(ආ) | වසර 06 ක් හෝ ඊට වැඩි සතුටුදායක සේවා කාලයක් සහිත III ශ්‍රේණියේ සේවකයින් | II ශ්‍රේණිය |

18:2 අන්තර්ග්‍රහනය කිරීමෙන් පසු ඊළඟ ශ්‍රේණියට උසස් කිරීමේදී අන්තර්ග්‍රහනය කිරීමට පෙර සේවයේ සේවා කාලය නව ව්‍යවස්ථාව යටතේ උසස්වීමට අදාල සේවා කාලයක් සේ සැලකේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2014/4/20 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම් 2014/4/25

18.3 අන්තර්ග්‍රහනයේදී නියමිත වැටුප් පියවර තීරණය කිරීමේදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) විධිවිධාන, ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 4 වගන්තිය හා ඊට අදාල සංශෝධිත චක්‍රලේඛ විධිවිධාන අදාල කර ගත යුතුය.

19. විධිවිධාන සළසා නොමැති කරුණු

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සළසා නැති කරුණු සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

අ උපලේඛණය - සේවයට අයත් තනතුරු

| පන්තිය | තනතුරු |
|---|---|
| විශේෂ ශ්‍රේණිය | ප්‍රධාන කාර්යාල කාර්ය සහායක |
| 1 ශ්‍රේණිය | 1. අනුපිටපත් යන්ත්‍ර ක්‍රියාකරු<br>2. ජායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු<br>3. දුරකථන ක්‍රියාකරු<br>4. ලේඛණ භාරකරු |
| 11 ශ්‍රේණිය | 1. කාර්යාල කාර්ය සහායක<br>2. මුරකරු<br>3. අරක්කැමි<br>4. පුස්තකාල සහායක<br>5. රසායනාගාර සහායක<br>6. ලේඛණාගාර සහායක |
| 111 ශ්‍රේණිය | 1. පාසල් කම්කරු<br>2. වතු කම්කරු<br>3. සනීපාරක්ෂක කම්කරු<br>4. පුස්තකාල සේවක<br>5. රසායනාගාර සේවක |

2008.05.27 දිනැති කොමිෂන් සභා රැස්වීම් දිනයේදී කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

| නම | අත්සන |
|---|---|
| 1. එස්. බී බැද්දේවෙල මහතා. (සභාපති) | [signature] |
| 2. උපාලි කිරිදිගොඩ මහතා. (සාමාජික) | [signature] |
| 3. යූ. ඒ බෝගහපිටිය මහතා. (සාමාජික) | [signature] |
| 4. වී. වී මාරිමුත්තු මහතා. (සාමාජික) | [signature] |
| 5. ඒ. එම්. ඒ ගෆූර් මහතා. (සාමාජික) | [signature] |

අනුමත කරමි / ~~නොකරමි~~.

[signature]

ටී.බී. කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
200.8. 08-05
/3/6